**මඩකලපුව මහනගර සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2018 මැයි 30 මහනගර සභා නගරාධිපතිවරයාට හා සභිකයන්ට යවා තිබුණි.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහනගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | මහනගර සභාවේ ගිණුම් උපචිත පදනමින් පිළියෙල කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේ අයකර ගත යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | අයකර ගත යුතු ඒවා සම්බන්ධයෙන් උපචිත ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ අයකර ගත යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | මහනගර සභාව විසින් ගණනය කර 2017 හා 2018 ජුනි මාසය දක්වා කාලපරිච්ඡේදය දක්වා දැවැදි හා පරිත්‍යාග මඟින් සභාව සතු කළ නිශ්චිත දේපල මත මුද්දර ගාස්තු රු.70,094,691 ක් ආදායම් වශයෙන් දක්වා තිබුණි. නැගෙනහිර පළාත් භාණ්ඩාගාරය විසින් පරිපාලන වියදම් ලෙස අයකළ 1% ක් හෙවත් රු.700,947 සහ මඩකලපුව දිස්ත්‍රික් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් | නිවැරදි ලෙස ගණනය කර ගිණුම්ගත කිරීම සිදුකළ යුතු වීම. | මුද්දර ගාස්තු රු.70,094,691 ක් ආදායම් ලෙස දක්වා තිබුණත්, නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයෙන් පරිපාලන වියදම් ලෙස සියයට 1 ක රු.700,947 ක් සහ මඩකලපුව සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට ගෙවිය යුතු රු.249,600 ක් අපගේ ආදායම් ලෙස දක්වා නොතිබුණු බැවින් වියදම් වශයෙන්ද දක්වා නැත. ඉදිරි වර්ෂයේදී ආදායම් ලෙස හා වියදම් ලෙස දක්වනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | ජනරාල් ගෙවා තිබූ රු.249,600 ක්, එලෙස ගෙවා තිබූ බවට සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම්වල දක්වා නොතිබුණි. | | |
| (ඇ) | මහනගර සභාව විසින් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට ජුනි අවසානය දක්වා පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු දේපල මාරු කිරීම, දැවැදි සහ පරිත්‍යාග මත අයකළ යුතු මුද්දර ගාස්තු රු.12,363,900 ක් ගණනය කර තිබුණත්, මූල්‍ය ප්‍රකාශනවල හිඟ මුද්දර ගාස්තු දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මෙම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි ලෙස ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බව. | ඉදිරි වර්ෂයේදී මෙවැනි වැරදි නිවැරදි කරනු ලැබේ. |
| (ඈ) | යුනෆ්ස් ආයතනයෙන් ලැබී තිබූ ලැප්ටොප් පරිගණක සහ යතුරු පැදියේ වටිනාකම 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර තිබුණත්, මෙහි වටිනාකම් තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | නිවැරදි ලෙස ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බව. | ඉදිරි වර්ෂයේදී මෙවැනි වැරදි නිවැරදි කරනු ලැබේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම්වල ඉදිරිපත් කර තිබූ රු.116,649,165 ක ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් පොලී ආදායමේ රඳවා ගැනීමේ බදු අඩු කළ පසු අගය ආදායම් ලෙස දක්වා තිබුණි. මෙලෙස අඩුකළ රඳවා ගැනීමේ බදු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි ලෙස ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බව. | ඉදිරි වර්ෂයේදී මෙවැනි වැරදි නිවැරදි කරනු ලැබේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අයකර ගත යුතු රු.55,469,852 ක වරිපනම් බදුවලින් රු.38,689,131 ක් අයකරගෙන නොතිබූ නමුත් එම අයකිරීම් මත දේපල හිමියන් වෙත ලබාදුන් වට්ටම් රු.1,510,960 ක් ගිණුම්වල ලබාදුන් වට්ටම් ලෙස දක්වා නොතිබුණි. | නිවැරදි ලෙස ගණනය කර ගිණුම්ගත කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ දේපල හිමියන්ගෙන් ලැබෙන දඩ ගාස්තු හා වට්ටම් මුදල් ආසන්න වශයෙන් එක සමානව තිබෙන බැවින් ගිණුම්වල එකතුව දැක්වේ. මින් පසුව එළැඹෙන කාලයේදී දඩ ගාස්තු ආදායම් ලෙසත්, වට්ටම්, ලබාදුන් වට්ටම් ලෙසත් ගිණුම්වල ඉදිරිපත් කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැයිස්තුගත වරිපනම් බදුවල තක්සේරු වටිනාකම රු.30,667,275 ක් වශයෙන් ගණනය කර තිබුණි. ගිණුම්වල මෙය රු.30,000,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ හිඟ වරිපනම් බදුවල වටිනාකම රු.667,275 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අනුමැතිය ලබාගන්නා තුරු නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂය සඳහා ලැයිස්තුගත කළ වරිපනම් බදුවල ඇස්තමේන්තු වටිනාකම රු.667,275 කින් අඩුවෙන් දැක්වීමට හේතුව මහනගර සභා දේපල සඳහාත් වරිපනම් තක්සේරු කර තිබීම නිසා ඒවා කපා හැරීම සඳහා අනුමැතිය ලබාගැනීමට යවා තිබීම වේ. |
| (ඌ) | මහනගර සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවැති ඉඩම් සහ ගොඩනැගිලිවල විස්තර හා ඒවාහි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදි ලෙස ගණනය කර ගිණුම් ගතකිරීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරි වර්ෂයේදී මෙවැනි දෝෂ නිවැරදි කරනු ලැබේ. |

**1.3.2 අසම්භාව්‍ය බැරකම්**

-----------------------

| විගණන නිර්දේශ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරී |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට මහනගර සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ගනු ලැබූ නඩු කටයුතු සහ බාහිර පාර්ශව විසින් මහනගර සභාවට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු වටිනාකම හා බාහිර පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු වටිනාකම් ගණනය කර අසම්භාව්‍ය බැරකම් ලෙස ගිණුම්වල ඉදිරිපත් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | 2018 දෙසැම්බර 31 දිනට මහනගර සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පැවරූ නඩු, බාහිර පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු මුදල් හිඟහිටි වශයෙන් දක්වා තිබූ අතර එය ශේෂ පත්‍රයේද හෙළිදරව් කර ඇත. |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

| | විගණන නිර්දේශ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරී |
|---|---|---|---|
| (i) | මූලා ප්‍රකාශනවල හිඟහිටව පවතින වරිපනම් බදු, කඩ කුලී හා අනෙකුත් ආදායම්වල එකතුව රු.36,448,190 ක් වුවත්, මෙම හිඟහිටි ප්‍රමාණයෙන් සියයට 75 ක ප්‍රතිශතයක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක සිට හිඟහිටව පැවතුණි. එසේ වුවත්, ඒ සම්බන්ධ ලේඛන, පොත්පත් සහ සනාථ කළ හැකි සාක්ෂි කිසිවක් නොමැතිව ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවතුණු අතර, හිඟහිටි ආදායම් අයකර ගැනීමට හෝ ලේඛනවලින් කපා හැරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැබිය යුතු හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීම. | මූලා ප්‍රකාශනවල හිඟහිටව පවතින, වරිපනම් බදු සහ අනෙකුත් ආදායම්වලින් අධික ප්‍රමාණයක් අයකරගෙන ඇති අතර ඒවා පොත්වලින් කපාහැරීමට කටයුතු කරමින් පවතී. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයේ මූලා ප්‍රකාශනවල හිඟහිටව පවතින වරිපනම් බදු රු.16,780,720 ක් වනාහි වට්ටම් රු.1,510,959 ක් ලබාදුන් ප්‍රමාණය ගැලපීම් නොකළ වටිනාකම වේ. මේ අනුව හිඟ හිට වශයෙන් දක්වා ඇති වටිනාකම සත්‍ය වටිනාකම ලෙස හෙළිදරව් කර නොතිබුණි. | නිවැරදි ලෙස ගණනය කර ගිණුම්ගත කළ යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු හිමියන්ගෙන් ලැබී ඇති දඩ ගාස්තු ප්‍රමාණය හා වට්ටම් ආසන්න වශයෙන් එක සමාන ප්‍රමාණයක් පෙන්වන බැවින් ගිණුම්වල මුළු වටිනාකම පෙන්වයි. මේ අනුව, හිඟහිට දක්වා ඇති අගය යම් අයුරකින් සත්‍ය වටිනාකම වේ. |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිර්දේශ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරී |
|---|---|---|
| මූලා ප්‍රකාශනවල ණයහිමියන් ලෙස දක්වා ඇති වැය, ණය හිමියන් රු.28,808,920 ක් වර්ෂ 05 ක අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කර | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හෝ ඒවා | මූලා ප්‍රකාශනවල ණය හිමියන් ලෙස දක්වා ඇති ණය හිමියන් වර්තමානයේ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| | තිබුණත්, ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ඒවා කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | කපාහැරීමට කටයුතු කළ යුතු වීම. |

**1.3.4 විගණනයට අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

---

**(අ) තොරතුරු ඉදිරිපත් නොවීම**

---

රු.195,232,508 ක් වටිනා ගිණුම් විෂයයන් 06 ක ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කරගත නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි | නිර්දේශය | අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (i) | යන්ත්‍රෝපකරණ | 29,975,090 | ස්ථාවර වත්කම් ලේඛනය අයිතිය තහවුරු කිරීමේ ලේඛන | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂ තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති යන්ත්‍රෝපකරණ, මෝටර රථ හා වාහන, ගබඩා තොග, ලී බඩු හා සවිකිරීම්, ණයහිමියෝ ආදී සඳහා වූ වටිනාකම විශේෂ කමිටුවක් විසින් තක්සේරු කර ගැලපීම් කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. |
| (ii) | මෝටර් රථ හා වාහන | 185,708,397 | ස්ථාවර වත්කම් ලේඛනය අයිතිය තහවුරු කිරීමේ ලේඛන | | |
| (iii) | ගබඩා තොග | 57,413,793 | තොග ලේඛන, විස්තරාත්මක උපලේඛන | | |
| (iv) | ලී බඩු හා සවිකිරීම් | 19,568,397 | තොග ලේඛන, විස්තරාත්මක උපලේඛන | | |
| (v) | වියදම් ණයහිමියෝ | 80,623,811 | ගෙවිය යුතු ණය ලේඛනය සහ ගෙවීම් වවුචර් | | |

**1.3.5 අනුකූල නොවීම්**

---

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

---

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අගය දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 41(2) | සමාලෝචිත වර්ෂයේ සන අපද්‍රව්‍ය ඉවත් කිරීම් කටයුතු කිරීම සඳහා ට්‍රැක්ටර් 4 ක්, | මුදල් රෙගුලාසි ප්‍රකාර අවශ්‍ය කටයුතු සිදු කළ | සාමාන්‍යයෙන් වාහන මිලදී ගැනීමේදී, මහනගර සභා ආඥා |

| | | | | |
|---|---|---|---|---|
| | | ගාර්බේජ් කොම්පැක්ටර් 02 ක් සහ මිනි ඇස්කැවැටර් රු.27,981,252 කට මිලදී ගෙන තිබුණි. මෙම යන්ත්‍ර මිලදී ගැනීමට පෙර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එලෙස අනුමැතිය ලබාගැනීමකින් තොරව යන්ත්‍ර මිලදී ගැනීම සිදුකර තිබුණි. | යුතු වීම. | පනත අනුව මහනගර සභා අරමුදලෙන් මිලදී ගනු ලැබීම නිසා ඒ සඳහා වන අනුමැතිය මහනගර සභා කමිටු රැස්වීමේදී ලබා ගනු ලැබේ. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විවිධ අවශ්‍යතා සඳහා තැන්පත් කරනු ලැබූ වර්ෂ දෙකකට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කරමින් පවතින, රු.5,777,898 ක තැන්පතු, ආපසු ලබා දී නිරවුල් කිරීමට හෝ නැතහොත් ආදායමට මාරුකිරීම අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. | 2019 වර්ෂයේදී අධික ප්‍රමාණයක තැන්පතු ආදායමට මාරු කර ඇත. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**-------------------------------**

**-**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන චක්‍රලේඛයේ (අ) ඡේදය | කාර්යාලයක සේවය කරන නිලධාරියෙකු රජයේ නිවාඩු දිනවල සහ සති අන්ත දිනවල රාජකාරී කිරීම වෙනුවෙන් අනුමත නිවාඩු දින දීමනා ලබාගැනීම සඳහා එම එක් දිනක් වෙනුවෙන් පැය අටකට (08) නොඅඩු පැය ගණනක් සේවය කරන නිලධාරියෙකුට නිවාඩු දින දීමනා ලබාදිය යුතු බව සඳහන් වුවත්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයට පටහැනිව කටයුතු කළ තනතුරු දරන නිලධාරීන් 04 දෙනෙකු සඳහා කාර්යාල වේලාව පැය 08 ක් සම්පූර්ණ නොකර තිබියදී එම දින | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතු වීම. | මෙම නිලධාරීන් 04 දෙනා තත්පර කිහිපයක් අඩුවීම නිසා මෙම නිවාඩු දින ගෙවීම් සිදුකර තිබුණි. ඉදිරියේදී මෙවැනි වැරදීම් සිදු නොවීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | වෙනුවෙන් රු.14,849 ක් නිවාඩු දින ගෙවීම් ලබා දී තිබුණි. | | |
| (ii) | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන චක්‍රලේඛයේ (ඇ) ඡේදය | මසකට දින 02 කට අධික දින ගණනක් නිලධාරියෙකු රාජකාරී කිරීම අවශ්‍ය වුවහොත් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් පූර්ව අනුමැතිය පෞද්ගලික වනසේ ලබාගත යුතු බව චක්‍රලේඛයේ සඳහන් කර ඇත. එසේ වුවත්, මහනගර සභාවේ රාජකාරී කරන හා රාජකාරී කරනු ලැබූ නිලධාරීන් 06 දෙනෙකු දින 2 කට අධික නිවාඩු දින ගණනක් රාජකාරී කිරීම වෙනුවෙන් පූර්ව අනුමැතිය පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබාගැනීමකින් තොරව රාජකාරී කිරීම සඳහා රු.348,788 ක නිවාඩු දින ගෙවීම් සිදු කර තිබුණි. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | මසකට දින 02 කට වඩා වැඩිපුර දින ගණනක් සඳහා නිලධාරියෙකු රාජකාරී කිරීම අවශ්‍ය වුවහොත් අදාල අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලික වනසේ ලබාගත යුතු බව චක්‍රලේඛයේ සඳහන් කර තිබුණත්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ අංක 7/1/2000 දරන චක්‍රලේඛය අනුව, පළාත් පාලන ආයතනවල අත්‍යවශ්‍ය සේවා කාර්යයන් ඉටු කිරීම සඳහා නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන්ට දින 05 ක් ලබාදිය හැකි බව සඳහන් කර තිබූ බැවින් එලෙස සිදුකර ඇත. |
| (iii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හි IV වගන්තිය | කාලය පදනම් කරගනිමින් අධික කාලයක් සහ නිවාඩු දින වැටුප් වැනි නිරන්තර රාජකාරී වේලාවෙන් පසුව කරනු ලබන පඩි විෂයයන්වලදී කාලය පදනම් කර ගැනීමේදී එම වේලාව ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු කිරීම අවශ්‍ය බව චක්‍රලේඛයේ සඳහන් කර ඇත. එසේ වුවත්, කාර්යාලගත නිලධාරීන් 05 දෙනෙකු විසින් පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කිරීම | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | නිලධාරීන් සම්බන්ධයෙන් වන විටද විදුලිය ඇනහිටීම නිසා හා ඇතැම් අවස්ථාවලදී හදිසි තත්ත්‍යන්වලදී බාහිර රාජකාරී කටයුතුවල නිරතවීමේදී ඇඟිලි සලකුණුවල සටහන් කිරීම සිදුනොවී අත්හැරීම් සිදු වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිවාඩු දින 37 ක් සම්පූර්ණ නොකර තිබියදී මහනගර සභාව විසින් නිවාඩු දින ගෙවීම් සිදුකර තිබුණි. | | |

(ඇ) **අනෙකුත් චක්‍රලේඛ**

-----------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් අමාත්‍යාංශයේ 2016 මාර්තු 17 දිනැති අයවැය චක්‍රලේඛයේ අංක 1/2016 හි 5.1 වගන්තිය | ට්‍රැක්ටර් 4 ක්, ගාබේජ් කොම්බැක්ටර් සහ මිනි එක්ස්කැවැටර් ආදිය මූලා ප්‍රතිපාදනවලින් වූ ලැබීම් ඵලදායීව භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව අදාළ අමාත්‍යාංශයේ හෝ පළාත් සභාවෙන් සෘජුවම මිලදීගත හැකි බව දන්වා තිබියදීත්, මෙම මිලදී ගැනීම් අදාළ අනුමැතීන් ලබා නොමැතිව මිලදී ගැනීම් සිදුකර තිබීම. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | මහනගර සභා ආඥා පනත අනුව, වාහන මිලදී ගැනීමේදී සභාවේ අනුමැතිය සහිතව සභාපතිවරයාට බලය තිබෙන නිසාත්, මහනගර සභා අරමුදල් බැවින් සභා අනුමැතිය සහිතවම මිලදී ගෙන තිබුණි. |
| (ii) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (ඇ) මාර්ගෝපදේශය | භාණ්ඩ හා සේවා ක්‍රියාවලියේදී කාලසටහන, ප්‍රසම්පාදන මාදිලිය (type) සහ ලංසු කැඳවීම් ලේඛන වර්ග සමඟ එකඟ වීමට ප්‍රසම්පාදන කමිටුව සටහන්, තාක්ෂණික ඇගයීම් කමිටුව සමඟත්, පෙර සූදානම් රැස්වීම් (pre bids meeting) පැවැත්විය යුතුය. එසේ වුවත්, ට්‍රැක්ටර් 04 ක්, ගාබේජ් කොම්බැක්ටර් 02 ක් සහ මිනි එක්ස්කැවේටර් ආදී මිලදී ගැනීම්වලදී එම රැස්වීම් පවත්වා නොතිබුණි. | නීති, රීති විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | භාණ්ඩ මිලදී ගැනීමේදී ඒ ඒ අදාළ කමිටුවල නිර්දේශ සමඟ හා පොදු සභාවේද අනුමැතිය සමඟ මිලදී ගැනීම් සිදුකර තිබුණි. |
| (iii) | නැගෙනහිර පළාත් 2018 ජුනි 04 දිනැති පළාත් චක්‍රලේඛ අංක PT/04(02)/2018 හි 7.1 ඡේදය ප්‍රකාරව | භාණ්ඩ මිලදී ගැනීම සහ සේවාවන් සපයා ගැනීමේ ක්‍රියාවලියේ රු.මිලියන 5 කට වැඩි භාණ්ඩ මිලදී ගැනීම්වලදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශවලට අනුව මිලදී ගත යුතුය. එසේ වුවත්, මහනගර සභාව විසින් | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | මහනගර සභා ආඥා පනත ප්‍රකාරව වාහන මිලදී ගැනීම් සිදුකර ඇත්තේ මහනගර සභාවේ අරමුදල්වලින් බැවින් එයට සීමාවන් ආඥා පනතේ සඳහන් කර නොතිබුණි. |

ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකත්වය දරන නියෝජිතයන් පදනම් කරගනිමින් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව පත්කර ඔවුන්ගේ නිර්දේශ අනුව, ට්‍රැක්ටර් 4 ක්, ගාබේජ් කොම්බැක්ටර් 02 සහ මිනි එක්ස්කැවේටර් ආදිය මෙම වක්‍රලේඛයට පටහැනිව මිලදී ගැනීම සිදුකර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.95,843,811 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.74,268,918 ක් වී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් සහ රැස්කළ ආදායම් ආදායම්

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, ලැයිස්තුගත ආදායම්, අයකළ ආදායම් සහ හිඟ ආදායම් සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | ලැයිස්තුගත කළ ආදායම් | අයකළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 31,500,000 | 58,757,243 | 41,232,501 | 17,524,742 | 23,800,000 | 47,230,435 | 20,541,050 | 26,689,385 |
| කුලී | 22,850,100 | 28,351,378 | 12,534,754 | 15,816,624 | 28,750,100 | 30,374,729 | 14,015,125 | 16,359,604 |
| බලපත්‍ර ගාස්තු | 11,640,000 | 13,427,672 | 10,683,589 | 2,744,083 | 11,145,000 | 13,036,787 | 10,949,115 | 2,087,672 |
| අනෙකුත් ආදායම් | 101,405,000 | 4,296,569 | 3,678,961 | 617,608 | 89,385,000 | 4,591,291 | 3,944,722 | 646,569 |

## 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහනගර සභා බල ප්‍රදේශයේ පවතින කොට්ඨාශ 20 ක ග්‍රාම සේවා වසම් 48 ක පවතින නිශ්චිත දේපල 42,477 ක් මත වරිපනම් තක්සේරු කළ යුතු වුවත්, නිශ්චල දේපල 38,476 ක් මත පමණක් වරිපනම් බදු තක්සේරු කර තිබුණි. | මහනගර සභා ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව පියවර ගත යුතු වීම. | ඔබ විසින් සඳහන් කර ඇති සියලුම නිශ්චල දේපල මත ක්ෂේත්‍ර නිලධාරීන් 15 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කර තක්සේරු කරමින් පවතී. තක්සේරු කිරීම් අවසන් වූ වහාම වරිපනම් බදු අයකිරීම සිදුකෙරේ. |
| (ආ) | වරිපනම් බදු අයකිරීම සඳහා වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට “K” ආකෘති පත්‍ර යවා තිබිය යුතුය. එලෙස ලබාදීම හේතුවෙන් ගාස්තු ගෙවීම් කිරීමේදී ප්‍රථමයෙන්ම ගෙවන දේපල හිමියන්ට වරිපනම් බදු මත වට්ටම් හිමිවන බව සඳහන්ව ඇත. එසේ වුවත්, මෙම පත්‍රිකාවලින් ඇතැම් පත්‍රිකා අදාළ කාලය ඉක්ම වූ පසුව දේපල හිමියන් වෙත බෙදා හැර තිබීම හා බෙදා නොහැර තිබීම වැනි ක්‍රියාවන් නිසා දේපල හිමියන්ට වරිපනම් බදු මත වූ වට්ටම් ලබාගැනීම අහිමිවීමේ අවස්ථා ඇති වී තිබුණි. | මහනගර සභා ආඥා පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. | වරිපනම් අයකිරීම වෙනුවෙන් වාර්ෂිකව සභාව විසින් දේපල හිමිකරුවන්ට “K” ආකෘති පත්‍ර යැවීම සාමාන්‍ය සිරිතකි. එසේ වුවත්, ආදායම් පරීක්ෂකවරුන්ගේ හිඟකම මෙම ආකෘති පත්‍ර යවා නොතිබීමට හේතුව වේ. දැනට මෙය නිරවුල් කිරීම පිණිස Online මඟින් අයකිරීම සඳහා කටයුතු යොදා ඇත. |
| (ඇ) | සභාව විසින් දේපල හිමියන් වරිපනම් නිසි කාල වකවානුවලදී ගෙවීම් පැහැර හැරී තිබූ අවස්ථාවලදී ඔවුන්ගෙන් දඩ ගාස්තු අය කෙරේ. එලෙස සමාලෝචිත වර්ෂයේ අයකළ දඩ ගාස්තු පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදි ලෙස ගණනය කර ගිණුම්වලට ගත යුතු වීම. | දැනට වරිපනම් බදු වෙනුවෙන් ක්‍රියාත්මක වන ක්‍රියාවලියේ මෙවැනි සිදුවීම් ඇතුළත් නොවීම හේතුවෙන් වට්ටම් හා දඩ ගාස්තු එක සමාන සේ සලකා මුළු එකතු ආදායම පමණක් ඉදිරිපත් කර ඇත. |

**2.2.3 අනෙකුත් වරිපනම්**

**---------------------**

**2.2.3.1 සංචාර නිකේතනවල ආදායම් මත බදු**

**----------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහනගර සභා බල ප්‍රදේශයේ 2016, 2017 සහ 2018 කාලපරිච්ඡේදයේ අයකළ සංචාරක නිකේතන මත ආදායම් බදු සම්බන්ධයෙන් මහනගර සභා බල ප්‍රදේශයේ 1968 වර්ෂයේ අංක 14 දරන සංචාරක සංවර්ධන පනත ප්‍රකාරව, ක්‍රියාත්මක කරනු ලබන හෝටල්, ආපනශාලා නැතහොත් තානායම් ආදිය ලියාපදිංචි කළ හො ශ්‍රී ලංකා සංචාරක අධිකාරියෙන් අනුමත කළ හෝ නිර්දේශිත අංශයක පිහිටා තිබූ විට මහනගර සභා ආඥා පනතේ 247 A හි 2 වැනි උප වගන්තිය අනුව, ලැබූ ආදායමින් 1% ක ප්‍රතිශතයකට නොවැඩි බද්දක් අයකළ යුතුය. විගණන පරීක්ෂාවේදී 2016 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් මස අවසානය දක්වා කාලපරිච්ඡේදයේ මහනගර සභා බල ප්‍රදේශයේ හෝටල් 07 කින් හෝටල් 04 ක් මත රු.1,195,757 ක් බදු අයකළ යුතුය. එසේ වුවත්, විගණන දිනය වන 2019 පෙබරවාරි 20 දින දක්වා රු.683,337 ක් පමණක් අයකර ගෙන තිබුණි. අයකළ යුතු හිඟ මුදල් රු.512,390 ක් අයකරගෙන නොතිබුණි. | මහනගර සභා ආඥා පනතට අනුකූලව ක්‍රියාකළ යුතුය. | දැනට හිඟහිටව පවතින ශේෂයද අයකර ගැනීමට ද කටයුතු යොදා ඇත. |

### 2.2.3.2 ඉඩම් විකුණුම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහනගර සභා බල ප්‍රදේශයේ 2017 සහ 2018 කාලපරිච්ඡේදයේ හුවමාරු කරනු ලැබූ නිශ්චල දේපල සම්බන්ධයෙන් මහනගර සභා ආඥා පනතේ 247E (1) (2) උපවගන්තිවලට අනුව, නිශ්චල දේපල විකුණුම් වටිනාකමින් 1% ක ප්‍රතිශතයක් බදු ලෙස අයකළ යුතුය. එසේ වුවත්, විගණන ආකෘතිය අනුව 2017 වර්ෂයේ සිට 2018 වර්ෂයේ සැප්තැම්බර් අවසානය දක්වා වූ කාලපරිච්ඡේදයේ මහනගර සභා බල ප්‍රදේශයේ නිශ්චල දේපල 1949 ක් රු.2,249,042,475 කට විකිණීම සම්බන්ධයෙන් 1% ක බදු ලෙස රු.22,490,425 ක් අයකිරීම සඳහා විගණන දිනය වන 2019 ජනවාරි 30 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ අනුව වාර්ෂිකව ආසන්න වශයෙන් රු.මිලියන 10 කට අධික ආදායමක් සභාව අහිමි කරමින් තිබුණි. | මහනගර සභා ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතු වීම. | මහනගර සභා බල ප්‍රදේශයේ 2017 සහ 2018 කාලපරිච්ඡේදයේ හුවමාරු කරනු ලැබූ නිශ්චල දේපල සම්බන්ධයෙන් මහනගර සභා ආඥා පනතේ 247 (1), (2) උප වගන්තිවලට අනුව, වෙන්දේසියේ විකුණනු ලබන නිශ්චල දේපල සඳහා පමණක් 1% ක බදු අයකළ යුතු බව සඳහන් කර ඇත. |

### 2.2.4 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

පළාත් සභා ප්‍රධාන ලේකම් සහ සියලුම නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.21,582,620 ක් සහ මුද්දර ගාස්තු රු.20,259,560 ක් ලැබිය යුතුව තිබුණි.

### 2.2.4.1 මුද්දර ගාස්තු

මහනගර සභා බල ප්‍රදේශයේ 2017 සහ 2018 කාලපරිච්ඡේදයේ ඉඩම් පැවරීම් කිරීම් මත මුද්දර ගාස්තු, මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් රැස්කර නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයේ ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවනු ලැබූ මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන විසින් ලබාගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | --------------- | ----------------------------------- |
| (අ) | නැගෙනහිර පළාත් සභාවේ 2010 වර්ෂයේ අංක 06 දරන මුද්දර ගාස්තු සංශෝධිත පනතේ 03 වගන්තිය අනුව, වාර්ෂිකව මුද්දර ගාස්තු අයකළ යුතු වුවත්, 2018 ජූලි සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා මුද්දර ගාස්තු මහනගර සභාව විසින් ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකර ගැනීමට විගණන දිනය වන 2019 ජනවාරි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු මහනගර සභාව විසින් ගණනය කර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අදාළ කාලපරිච්ඡේදය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා මුද්දර ගාස්තු මහනගර සභාව විසින් ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට යවා ඇත. |
| (ආ) | නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නැගෙනහිර පළාත් සභා 2008 වර්ෂයේ අංක 01 දරන බදු හා බලපත්‍ර පැනවීමට හා රැස්කිරීම සඳහා වන මූල්‍ය පනතේ 37 වැනි පරිශිෂ්ඨය ප්‍රකාරව මහනගර සභා බල ප්‍රදේශයේ පවතින නිශ්චල දේපල මාරු කිරීමේදී නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2016, 2017 හා 2018 දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ ඍජුව හා ජංගම සේවාවන් මඟින් අයකරනු ලැබූ අමතර මුද්දර ගාස්තු සම්බන්ධයෙන් රු.1,551,115 ක් දේපල හිමියන් විසින් නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම් කර තිබුණි. එම මුද්දර ගාස්තු ගණනය කර අයකිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. | නැගෙනහිර පළාත් සභා 2008 වර්ෂයේ අංක 1 දරන බදු හා බලපත්‍ර පැනවීමට හා රැස්කිරීමට මූල්‍ය පාලන පනතේ 37 වැනි පරිශිෂ්ඨය ප්‍රකාරව මුද්දර ගාස්තු මහනගර සභාව විසින් ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල් නියමිත කාල වකවානු තුළදී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ මුද්දර ගාස්තු ගණනය කර අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්යසාධනය**

---------------

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත්, සහ මහජන සුවය පහසුකම් සහ සුභසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

## (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහනගර සභා ආඥා පනතේ 272 වැනි වගන්තිය ප්‍රකාරව, මුක්‍ය කරුණු 34 ක් සම්බන්ධයෙන් අනු රීතීන් ක්‍රියාත්මක කළ යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් මෙම මුක්‍ය කරුණු සඳහා අනු රීතීන් සකස් කර නොතිබුණි. | මහනගර සභා ආඥා පනතේ 272 වැනි වගන්තිය ප්‍රකාර අනු රීතීන් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | මහනගර සභා ආඥා පනතේ 272 වැනි වගන්තිය ප්‍රකාර ඇතැම් වැදගත් කරුණු 34 ක් සම්බන්ධයෙන් අනු රීතීන් ක්‍රියාත්මක කර අනුමැතිය සඳහා යවා ඇත. |

## (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහනගර සභා ආඥා පනතේ 272 වැනි වගන්තිය ප්‍රකාර අනු රීතීන් සකස් කර ඒ අනුව සභාවේ කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වුවත්, එම කාර්යයන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මහනගර සභා ආඥා පනතේ 272 වැනි වගන්තිය ප්‍රකාර අනු රීතීන් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | මේ වන විට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර ඇත. |

## (ඇ) තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | 2015 වර්ෂයේ තිරසාර සංවර්ධන සම්මේලනයේ තීරණයට අනුව කාර්යයන් ක්‍රියාත්මක කිරීම. | 2030 වර්ෂයේ ලඟා කරගත යුතු සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් නිර්ණය කරනු ලබන දර්ශකයන් පිළියෙල කිරීමට පියවර ගෙන ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාවේ සාමාන්‍ය කළමනාකරණ මෙහෙයුම් සම්බන්ධ නිරීක්ෂණයන් මෙහිදී අඩංගු විය යුතුය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ට්‍රැක්ටර් 4 ක්, ගාබේජ් කොම්බැක්ටර් 02 ක් සහ මිනි එක්ස්කැවේටර් ආදිය මිලදී ගැනීමට ප්‍රථම මෙම යන්ත්‍රවල අවශ්‍යතාවය, ශක්‍යතා අධ්‍යයනය සහ මූල්‍යායනය කිරීම ආදිය සැලකිල්ලට ගත යුතුය. එසේ වුවත්, සභාව විසින් මෙම යන්ත්‍ර භාවිතා කිරීමේ අංශයේ (සෞඛ්‍ය අංශය) ඉල්ලීම සහ ශක්‍යතා අධ්‍යයනය වැනි කිසිවකින් තොරව මේවා මිලදී ගෙන තිබුණි. | චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතු වීම. | ඔබ විසින් ලබා දී තිබූ නිර්දේශයන් මින් පසුව එළැඹෙන කාලයේදී ක්‍රියාත්මක කිරිමට පියවර ගෙන ඇත. |
| (ආ) | මිනි එක්ස්කැවේටර් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව තාක්ෂණික ඇගයීම් කමිටුවල තීරණයට අනුව මූලික සියලුම විස්තර සම්පූර්ණ කළ සෙනොක් ට්‍රේඩ් කොම්පැණි ආයතනයෙන් මිලදී ගනු ලබන බව තීරණය කර අදාළ සමාගමට මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කර තිබුණි. එසේ වුවත්, 2018 ඔක්තෝබර් 26 දින එම ඇණවුම අවලංගු කර ප්‍රසම්පාදන කමිටුවේ 2018 නොවැම්බර් 15 දිනැති තීරණය සමඟ ඇගයීම් කමිටුවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශය පමණක් සැලකිල්ලට ගෙන දෙවැනි ලංසුකරු වන යුනයිටඩ් මෝටර් පීඑල් ආයතනයෙන් මිලදී ගනු ලබන බව තීරණය කර රු.6,425,652 කට මිලදී ගෙන තිබුණි. මෙලෙස තීරණ සම්පූර්ණ කිරීම, ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඵලදායී තීරණ නොගැනීම පිළිබිඹු කරයි. | චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතු වීම. | ඔබ විසින් ලබා දී තිබූ නිර්දේශයන් මින් පසුව එළැඹෙන කාලයේදී ක්‍රියාත්මක කිරිමට පියවර ගෙන ඇත. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ට්‍රැක්ටර් 4 ක්, ගාබේජ් කොම්බැක්ටර් 02 ක් සහ මිනි එක්ස්කැවේටරය මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදන කාලසටහන, ප්‍රසම්පාදනය කිරීමේ ආකාරය සහ ලංසු කැඳවීමේ ආකාරය පිළිබඳ එකඟතාවයකට එළැඹීමට ප්‍රසම්පාදන කමිටුව සමඟත්, තාක්ෂණික ඇගයීම් කමිටුව සමඟත් රැස් වී එක් පූර්ව රැස්වීමක් පැවැත්විය යුතුව තිබුණද, එලෙස රැස්වීමක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන විගණන පනතේ 16(2) උප රීතිය අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන විගණන පනතේ 16(2) උපරීතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි වර්ෂයේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ඇත. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක වී නොතිබුණි. | විධිමත් ලෙස සැලසුම් කර අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වීම. | 2018 වර්ෂයේ මහනගර සභාවේ අභ්‍යන්තර විගණන කාර්යයන් යම් ආකාරයකට ක්‍රියාත්මක වී තිබුණි. වර්තමානයේ වැඩි වශයෙන් එම වගකීම් ඉටුකිරීම පිණිස එක් නිලධාරියෙකු අනුයුක්ත කර ඇත. |

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර රැස්වීම් පවත්වා නොතිබුණි. | විධිමත් අයුරින් සැලසුම් කර අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වීම. | 2018 වර්ෂය සඳහා සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පවත්වා තිබුණි. |

## 4.3 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | විගණන නිරීක්ෂණය | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | චක්‍රලේඛ හා විධිවිධානවලට අනුකූලව ක්‍රියාකළ යුතු වීම. | ඉදිරි කාලවලදී ඔබ විසින් සඳහන් කර ඇති පාලනයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කරනු ලැබේ. |
| (ආ) | අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය වර්ෂවල තථ්‍ය වියදම් පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම. | | |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යාම<br>(ii) සභාව විසින් භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීම සඳහා කටයුතු කිරීම. | | |
| (ඇ) | තොග පාලනය | මහනගර සභාවේ ගබඩා තොගය විධිමත් අයුරින් පවත්වා ගෙන ගොස් නොතිබූ අතර තොග සම්බන්ධයෙන් කළමනාකරණ පාලන දුර්වලතා දක්නට වූ බැවින් තොග සම්බන්ධයෙන් වංචාවක් සිදු විය හැකි අවස්ථා තිබෙන බව දක්නට ලැබුණි. | | |